රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

මහජනතාව වෙත කරන නිවේදනයයි

රජයේ සංවර්ධන ප්‍රතිපත්තිමය අවශ්‍යතාවන්ට සරිලන පරිදි රාජ්‍ය සේවයට අදාළව පවත්නා නීති-රීති හා රෙගුලාසි සමාලෝචනයට ලක් කර සරල කිරීම සඳහා මහජන අදහස් හා යෝජනා කැඳවීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ මහ නගර සභා නගර සභා ප්‍රාදේශීය සභා යන පළාත් පාලන ආයතනවලින් මගින් මහජනතාවට සැලසෙන සේවාවන් තවත් කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය නෛතික හා පරිපාලන ප්‍රතිසංස්කරණ සිදු කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය (අංක **අමප/25/0175/816/008.** 2025.02.10) ලැබී ඇත. මෙම ප්‍රතිසංස්කරණ වල අරමුණ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පරිපාලන ආයතනවල ක්‍රියාකාරිත්වයට අදාළ නීති රීති සරල කර, එමඟින් මහජන සේවාවන් තවත් කාර්යක්ෂම කර ගැනීම වේ. එබැවින්, මෙම ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා මහජනතාවගේ අදහස් හා යෝජනා ලබා ගැනීමට අදහස් කෙරේ.

ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පරිපාලන සහ පළාත් පරිපාලනය යාන්ත්‍රණය තවමත් ක්‍රියාත්මක වන්නේ බ්‍රිතාන්‍ය යටත්විජිත සමයේ ආඥා පනත් සහ 1950 සිට 1970 දශකවල පනවනු ලැබූ නීති, රෙගුලාසි හා ක්‍රියා පටිපාටි අනුවය. එවකට පැවති සමාජ ආර්ථික තත්ත්වය, ප්‍රවාහන හා සන්නිවේදන යටිතල පහසුකම් පදනම් කරගනිමින් මෙම ක්‍රියා පටිපාටි ගොඩනඟා ඇති අතර, වර්තමාන සංවර්ධන අවශ්‍යතා සහ මහජන සේවාවන් කාර්යක්ෂමව ඉටු කිරීමට මෙම ක්‍රියා පටිපාටි කාලීනව සංශෝධනය විය යුතු වේ.

ඔබගේ අදහස් හා යෝජනා අපට එවන්න!

මෙම අමාත්‍යාංශයේ විෂය පථයේ සහ අධීක්ෂණය යටතේ පවතින පහත සඳහන් ආයතනවලින් ඔබ ලබා ගන්නා රාජ්‍ය සේවාවන් සම්බන්ධයෙන් ඔබ නිරීක්ෂණය කර ඇති නීති, රෙගුලාසි හා ක්‍රියා පටිපාටි ගැටළු, එම ගැටළු විසඳීම සඳහා වන ඔබගේ යෝජනා අප වෙත එවන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

සම්බන්ධිත රාජ්‍ය ආයතන:

දිස්ත්‍රික් ලේකම් කාර්යාල
ප්‍රාදේශීය ලේකම් කාර්යාල
මහ නගර සභා
නගර සභා
ප්‍රාදේශීය සභා
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
විග්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

ඔබේ අදහස් එවිය හැකි මාර්ග:

විද්‍යුත් තැපෑල : inforar@moha.gov.lk
Whatsapp : 0740896768
ලිපිනය : ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ අංශය, 17 වන මහල, "නිල මැදුර", ඇල්විටිගල මාවත, කොළඹ 05

ඔබගේ අදහස් එවිය යුතු ආකෘතිය :

ගැටළුවට අදාළ ආයතනය	හඳුනාගත් නෛතික ගැටළුව (නීති, රෙගුලාසි හා ක්‍රියා පටිපාටි)	යෝජිත විසඳුම

ඔබගේ අදහස් සහ යෝජනා (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) පහසු භාෂා මාධ්‍යයකින් **2025.04.18** දිනට පෙර ඉදිරිපත් කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමු. එය ඔබගේ අනන්‍යතාවය සහිතව හෝ රහිතව ඉදිරිපත් කළ හැකිය. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පරිපාලන යාන්ත්‍රණය මඟින් සිදුකරන මහජන සේවය කාර්යක්ෂම කිරීම උදෙසා ඔබ ලබා දෙන අදහස් ඉහමත් සේ අගය කොට සලකමි.

වැඩි විස්තර සඳහා :
අතිරේක ලේකම් (ප්‍රාදේශීය පරිපාලන·ප්‍රතිසංස්කරණ),
දුරකථන අංක : 0112050434 / 011 2050430

ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
2025.03.18